සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# ලංකා ඉතිහාසය - I

**13 ශ්‍රේණිය** | **කාලය පැය 01 යි.**

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

---

- අංක 01 සිට 05 දක්වා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

(01) ශ්‍රී ලංකාවේ පැරණි යුගයේ ඉතිහාසය ගොඩනැගීමට වඩාත් ප්‍රයෝජනවත් මූලාශ්‍ර කෘතීන් අඩංගු වන්නේ පහත දැක්වෙන කවර කාණ්ඩයේද?

(1) මහාවංශය, රාජාවලිය, දාඨාවංස, කව්සිළුමිණ
(2) මහාවංශය, දීපවංශය, වංසත්ථප්පකාසිනි, රාජාවලිය
(3) මහාවංශය, දීපවංශය, අමාවතුර, රාජාවලිය
(4) මහාවංශය, කව්සිළුමිණ, දීපවංශය, රාජාවලිය
(5) මහාවංශය, වංසත්ථප්පකාසිනි, අමාවතුර, රාජාවලිය (........)

(02) මහාවංශයට ලියන ලද ටීකාව වූයේ,

(1) වංසත්ථප්පකාසිනි (2) කාම්බෝජ මහාවංශ (3) දීපවංශ
(4) ගණ්ඨිපදත්ථවණ්ණනා (5) සිංහල අට්ඨකතා (........)

(03) රාජ්‍ය පාලන මධ්‍යස්ථාන නිරිත දිගට සංක්‍රමණය වීමේ නිවැරදි අනුපිළිවෙල වන්නේ,

(1) දඹදෙණිය, කුරුණෑගල, යාපහුව, ගම්පොළ, කෝට්ටේ.
(2) දඹදෙණිය, කුරුණෑගල, ගම්පොළ, යාපහුව, කෝට්ටේ.
(3) දඹදෙණිය, යාපහුව, ගම්පොළ, කුරුණෑගල, කෝට්ටේ.
(4) දඹදෙණිය, ගම්පොළ, යාපහුව, කුරුණෑගල, කෝට්ටේ.
(5) දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ. (........)

(04) වට්ටගාමිණී අභය රජුට මුහුණපෑමට සිදු වූ දුෂ්කරතා දැක්වෙන්නේ කවර පේළියේද?

(1) කාලිංග මාඝගේ ආක්‍රමණ, මහා සාගතය, තීය බ්‍රාහ්මණයාගේ කැරැල්ල.
(2) දෙමළ අධිපතීන්ගේ ආක්‍රමණ, මහා සාගතය, තීය බ්‍රාහ්මණයාගේ කැරැල්ල
(3) කාලිංග මාඝගේ ආක්‍රමණ, මහා සාගතය, මෝරිය ලම්භකරණ ගැටුම.
(4) දෙමළ අධිපතීන්ගේ ආක්‍රමණ, කාලිංග මාඝගේ ආක්‍රමණ, මහා සාගතය.
(5) දෙමළ අධිපතීන්ගේ ආක්‍රමණ, තීය බ්‍රාහ්මණයාගේ කැරැල්ල, කාලිංග මාඝගේ ආක්‍රමණ. (........)

(05) ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරුන්ගේ නම් පහත දැක්වෙන්නේ කවර ලැයිස්තුවේද?

(1) ෆෙඩ්රික් නෝර්ත්, තෝමස් මෙට්ලන්ඩ්, එඩ්වඩ් බාන්ස්, ජෝන් ඩොයිලි, රොබට් බ්‍රවුන්රිග්.
(2) ෆෙඩ්රික් නෝර්ත්, ජෝන් ඩේවි, තෝමස් මෙට්ලන්ඩ්, එඩ්වඩ් බාන්ස්, රොබට් බ්‍රවුන්රිග්.
(3) සී. එච්. කැමරන්, ෆෙඩ්රික් නෝර්ත්, රොබට් බ්‍රවුන්රිග්, තෝමස් මෙට්ලන්ඩ්, ජෝන් ඩොයිලි.
(4) ෆෙඩ්රික් නෝර්ත්, එඩ්වඩ් බාන්ස්, තෝමස් මෙට්ලන්ඩ්, ජෝන් ඩොයිලි, ඉමර්සන් ටෙනන්ට්.
(5) ෆෙඩ්රික් නෝර්ත්, තෝමස් මෙට්ලන්ඩ්, රොබට් බ්‍රවුන්රිග්, එඩ්වඩ් බාන්ස්, ටොරින්ටන් සාමි. (........)

- **අංක 06 සිට 10 තෙක් වූ එක් එක් ප්‍රශ්නය සඳහා නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X සහ Y තීරුවල දී ඇත. Y තීරුවේ දක්වා ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකින් ගැලපේ. එහෙත් ඒවා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලට නොවේ. Y තීරුව X තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙලට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය. නිවැරදි සංයෝගයට අයත් අංකය ඉදිරියේ ඇති තිත් ඉරමත ලියන්න.**

(06)

| | X | | Y |
|---|---|---|---|
| (i) | උරාතොට | A | මාතොට |
| (ii) | ජම්බුකෝලපට්ටන | B | තයිට්ස් |
| (iii) | මහාතිත්ථ | C | මාතර |
| (iv) | හීමතිත්ථ | D | බෙන්තොට |
| (v) | නීලවාලතිත්ථ | E | සම්බිලිතුරෙයි |

(1) EDABC (2) DEACB (3) CBDAE (4) CDAEB (5) BEADC (........)

(07)

| | X | | Y |
|---|---|---|---|
| (i) | බුත්සරණ | A | කුරුණෑගල යුගය |
| (ii) | සද්ධර්මරත්නාවලිය | B | කෝට්ටේ යුගය |
| (iii) | දළදාසිරිත | C | ගම්පොළ යුගය |
| (iv) | මයුර සන්දේශය | D | පොළොන්නරු යුගය |
| (v) | කාව්‍යශේඛරය | E | දඹදෙණි යුගය |

(1) EDABC (2) DEACB (3) CBDAE (4) CDAEB (5) BEADC (........)

(08)

| | X | | Y |
|---|---|---|---|
| (i) | ථූපාරාම දාගැබ | A | මිහින්තලේ |
| (ii) | කණ්ඨක චේතිය | B | අනුරාධපුර |
| (iii) | සත්මහල් ප්‍රාසාදය | C | ගම්පොළ |
| (iv) | නියම්ගම්පාය | D | පොළොන්නරුව |
| (v) | සුනේත්‍රා දේවි පිරිවෙන | E | පැපිලියාන |

(1) BEDAC (2) BADCE (3) BACDE (4) BEDCA (5) BDECA (........)

(09)

| | X | | Y |
|---|---|---|---|
| (i) | වැලිවිට සරණංකර හිමි | A | බෞද්ධ ගිහි අධ්‍යාපනය |
| (ii) | කෝල්බෲක් කොමිසම | B | භික්ෂු අධ්‍යාපනය |
| (iii) | එච්. එස්. ඔල්කොට් | C | නිදහස් අධ්‍යාපනය |
| (iv) | ආරුමුග නාවලර් | D | හින්දු අධ්‍යාපනය |
| (v) | සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර | E | ඉංග්‍රීසි අධ්‍යාපනය |

(1) EDABC (2) DEACB (3) CBDAE (4) CDAEB (5) BEADC (........)

(10)

| | X | | Y |
|---|---|---|---|
| (i) | මුඩු බිම් පනත | A | 1871 |
| (ii) | ගම්සභා පනත | B | 1840 |
| (iii) | වාරිමාර්ග පනත | C | 1856 |
| (iv) | මහාමාර්ග පනත | D | 1848 |
| (v) | මහනගර සභා පනත | E | 1865 |

(1) BDECA (2) BCDEA (3) BADEC (4) BDCEA (5) BACDE (........)

- **අංක 11 සිට 15 තෙක් වූ එක් එක් ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.**

(11) අනුරාධපුරයේ ඉදිකර ඇති ස්තූපවල නිවැරදි අනුපිළිවෙල,

(1) ථූපාරාමය, මිරිසවැටිය, රුවන්වැලිසෑය, අභයගිරිය, ජේතවනය

(2) ථූපාරාමය, රුවන්වැලිසෑය, අභයගිරිය, මිරිසවැටිය, ජේතවනය

(3) ථූපාරාමය, මිරිසවැටිය, අභයගිරිය, රුවන්වැලිසෑය, ජේතවනය

(4) ථූපාරාමය, අභයගිරිය, මිරිසවැටිය, රුවන්වැලිසෑය, ජේතවනය

(5) ථූපාරාමය, ජේතවනය, මිරිසවැටිය, අභයගිරිය, රුවන්වැලිසෑය (........)

(12) පුරාණ සහ මධ්‍යකාලීන ශ්‍රී ලංකාවේ අගනගරවල නිවැරදි පිළිවෙළ,

(1) පොළොන්නරුව, දඹදෙණිය, කුරුණෑගල, යාපහුව, ගම්පොළ.

(2) පොළොන්නරුව, දඹදෙණිය, ගම්පොළ, කුරුණෑගල, යාපහුව.

(3) පොළොන්නරුව, දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොළ.

(4) පොළොන්නරුව, යාපහුව, දඹදෙණිය, කුරුණෑගල, ගම්පොළ.

(5) පොළොන්නරුව, කුරුණෑගල, යාපහුව, දඹදෙණිය, ගම්පොළ. (........)

(13) පහත සඳහන් වැව් ඉදිකරන ලද කාලය අනුව නිවැරදි අනුපිළිවෙල,

(1) අභය වැව, මින්නේරි වැව, නාච්චදූව වැව, කලාවැව, පරාක්‍රම සමුද්‍රය.

(2) අභය වැව, කලා ඔය, මින්නේරි වැව, නාච්චදූව වැව, පරාක්‍රම සමුද්‍රය.

(3) නාච්චදූව වැව, අභය වැව, කලාවැව, මින්නේරි වැව, පරාක්‍රම සමුද්‍රය.

(4) කලාවැව, අභය වැව, නාච්චදූව වැව, මින්නේරි වැව, පරාක්‍රම සමුද්‍රය.

(5) අභය වැව, නාච්චදූව වැව, මින්නේරි වැව, කලාවැව, පරාක්‍රම සමුද්‍රය. (........)

(14) එළාර රජුට සහය දීම සඳහා පැමිණි දකුණු ඉන්දීය දමිළ නායකයාගේ නම කුමක්ද?

(1) දීඝජන්තු (2) භල්ලුක (3) පනයමාර

(4) පුළහත්ථ (5) දාඨික (........)

(15) බුද්ධාගම නගාසිටුවීම සඳහා ඉතා වැදගත් දායකත්වයක් ලබා දුන් නායක්කාර් පාලකයා වන්නේ,

(1) දෙවන රාජසිංහ රජු (2) දෙවන විමලධර්මසූරිය රජු

(3) ශ්‍රී විජය රාජසිංහ රජු (4) රාජාධි රාජසිංහ රජු

(5) කීර්ති ශ්‍රී රාජසිංහ රජු (........)

- **අංක 16 සිට 20 තෙක් වූ සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු 05 බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

(16) වලගම්බා රජු මුහුණ දුන් අභියෝග

(1) තීය බ්‍රාහ්මණයා විසින් ඇති කරන ලද කැරැල්ල

(2) බැමිණිතියා සාය

(3) සත් දමිළ ආක්‍රමණය

(4) කපිසිසගේ මරණින් පසු සෙන්පතියන් වළගම්බා රජු හැරයාම.

(5) මාසගේ ආක්‍රමණ (........)

(17) රයිගම,

(1) රයිගම, අලකේශ්වර පවුලේ ජාත භූමිය විය.

(2) රයිගම වීර අලකේශ්වර, කෝට්ටේ බලකොටුව ඉදි කරවීය.

(3) ථූපවංසය රයිගම දී රචනා කරන ලදී.

(4) හයවන පරාක්‍රමබාහු රජතුමා සිය පාලනය රයිගමින් ඇරඹීය.

(5) විජයබා කොල්ලයෙන් පසු රයිගම් බණ්ඩාර රයිගම පාලකයා බවට පත්විය. (........)

(18) ශ්‍රී ලංකාවට බුද්ධාගම හඳුන්වා දීම,

(1) මහා සංඝයාට මහාමේඝනාව ප්‍රදානය කිරීම.

(2) මහා විහාරය පිහිටුවීම.

(3) හේමමාලි කුමරිය විසින් දන්ත ධාතූන් රැගෙන ඒම.

(4) භික්ෂු ශාසනය පිහිටුවීම.

(5) සංඝමිත්තා තෙරණියගේ පැමිණීම. (........)

(19) 1815 උඩරට ගිවිසුම,

(1) ශ්‍රී වික්‍රම රාජසිංහ රාජු උඩරට සිහසුනෙන් පහ කෙරිණි.

(2) උඩරට රදළ ප්‍රධානීන්ගේ බලතල හා වරප්‍රසාද ආරක්ෂා කෙරිණ.

(3) බුද්ධාගම සහ දේව ආගම කඩ කළ නොහැකි බවට ප්‍රකාශ කෙරිණි.

(4) උඩරට හා මුහුදුබඩ ප්‍රදේශ සම්බන්ධ කොට ඒකාබද්ධ පරිපාලන තන්ත්‍රයක් ඇති කෙරිණි.

(5) උඩරට රාජධානියට අයත් වූ ප්‍රදේශ බ්‍රිතාන්‍ය කිරුළ යටතට ගෙනෙන ලදී. (........)

(20) මහනුවර රාජධානියේ බිඳවැටීම

(1) රජු සහ රදළයන් අතර වූ ගැටුම්.

(2) ටොරිංටන් සාමිගේ පාලන ප්‍රතිපත්තියේ දුර්වලතා.

(3) යාපනයේ හින්දු විද්‍යාලය ආරම්භ කිරීම.

(4) මුස්ලිම් නේෂන් පුවත්පත ආරම්භ කිරීම.

(5) ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම. (........)

- **අංක 21 සිට 25 තෙක් වූ එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති A, B, C හා D යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා**

**A හා B පමණක් නිවැරදි නම් ............. (1) ද**

**B හා C පමණක් නිවැරදි නම් ............. (2) ද**

**C හා D පමණක් නිවැරදි නම් ............. (3) ද**

**A හා C පමණක් නිවැරදි නම් ............. (4) ද**

**ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් ............. (5) ද**

**වරහන තුළ යොදන්න.**

(21) පොළොන්නරු යුගයේදී හින්දු ආගම පැතිරයාම සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?

(A) ශ්‍රී ලාංකීක සංස්කෘතිය සම්බන්ධයෙන් විශාල හින්දු බලපෑමක් දැකිය හැකිය.

(B) ශිව දේවාල ගොඩනංවනු ලැබීය.

(C) නිශ්ශංකමල්ල රජතුමා හින්දු ආගමට අනුග්‍රහය දැක්වූ බව ගල්පොත සෙල්ලිපියේ සඳහන් වේ.

(D) කල්‍යාණවතී රැජිණ විසින් කතරගම ස්කන්ධ දේවාලය ඉදිකරනු ලැබීය. (........)

(22) වැලිවිට සරණංකර නාහිමි සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?

(A) වැලිවිට සරණංකර නාහිමියන් රාජ අනුග්‍රහය යටතේ පැවිදි වීම.

(B) සිල්වත් සමාගම පිහිටුවීම.

(C) සියමෙන් උපසම්පදාව ගෙන ඒමට මූලිකත්වය ගැනීම.

(D) ශ්‍රී ලංකාවේ අවසන් සඟරජ වීම. (........)

(23) වට්ටගාමිණී අභය රජුට මුහුණ පෑමට සිදු වූ දුෂ්කරතා සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර සාධකය/ සාධක නිවැරදි වේද?

(A) කාලිංග මාඝ ආක්‍රමණය (B) තීය බ්‍රාහ්මණයාගේ කැරැල්ල

(C) මහා සාගතය (D) චන්ද්‍රභානුගේ ආක්‍රමණය (........)

(24) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසි පාලනය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර සාධකය/ සාධක නිවැරදි වේද?

(A) ඉංග්‍රීසි අධ්‍යාපනයේ පැතිරීම. (B) රෝමානු කතෝලික ආගම හඳුන්වා දීම.

(C) රෝම ලන්දේසි නීතිය හඳුන්වා දීම. (D) ප්‍රොතෙස්තන්ත්‍රවාදය හඳුන්වා දීම. (........)

(25) ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම විකාශයේ ප්‍රධාන අවස්ථා සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර සාධකය/ සාධක නිවැරදි වේද?

(A) ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම. (B) විධායක කාරක සභා ක්‍රමය හඳුන්වා දීම.

(C) කැබිනට් ආණ්ඩුක්‍රමය හඳුන්වා දීම. (D) ජාති මූල නියෝජනය අහෝසි කිරීම. (........)

- **අංක 26 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.**

(26) ලම්භකරණ පෙළපතේ පළමු පාලකයා කවුද?

(1) යසලාලක තිස්ස (2) සුභ (3) වසභ

(4) වංකනාසික තිස්ස (5) පළමුවන ගජබාහු (........)

(27) කන්තලේ වැව ඉදිකරවන ලද්දේ කවරකු විසින්ද?

(1) දෙවන මොග්ගල්ලාන (2) දෙවන අග්ගබෝධි (3) දෙවන මහින්ද

(4) දෙවන සේන (5) දෙවන උදය (........)

(28) විද්‍යෝදය පිරිවෙන පිහිටුවන ලද්දේ කවරකු විසින්ද?

(1) වලානේ සිද්ධාර්ථ හිමි (2) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි

(3) රත්මලානේ ධර්මාරාම හිමි (4) රත්මලානේ ධර්මාලෝක හිමි

(5) වැලිවිටියේ සෝරත හිමි (........)

(29) කොළඹ සහිරා විද්‍යාලය පිහිටුවන ලද්දේ කවරෙකු විසින්ද?

(1) එම්. සී. සිද්දි ලෙබ්බේ (2) වපුචි මරික්කාර් (3) ටී. බී. ජායා

(4) ඒ. සී. මරික්කාර් (5) බද් උද්දීන් මොහොමඩ් (........)

(30) පණ්ඩුකාභය රජතුමාගේ අනුප්‍රාප්තිකයා කවුද?

(1) සුමිත්ත (2) උපතිස්ස (3) මුටසිව

(4) අභය (5) පණ්ඩුවාසුදේව (........)

- අංක 31 සිට 40 තෙක් වූ ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| (1) | නිවැරදිය. | වැරදිය. |
| (2) | නිවැරදිය. | නිවැරදිය. |
| (3) | වැරදිය. | වැරදිය. |
| (4) | වැරදිය. | නිවැරදිය. |
| (5) | නිවැරදිය. | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය | |
|---|---|---|---|
| (31) | දීපවංශයට ලියන ලද ටීකාව විසුද්ධිමග්ග නමින් හැඳින්වේ. | සිරිමෙඝවණ්ණ රාජ්‍ය සමයේදී දන්ත ධාතූන් වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කරනු ලැබීය. | (........) |
| (32) | ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත් 1802 දී බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් බවට පත් විය. | ආචාර්ය එන්. එම්. පෙරේරා මහතා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ප්‍රථම විපක්ෂ නායකයා විය. | (........) |
| (33) | ශ්‍රී ලංකා ඉතිහාස සම්ප්‍රදායේ දැනට ශේෂව පවතින ආදිතම වංශකතාව දීපවංශයයි. | දීපවංශයේ දෙවන කොටස චූලවංශය නමින් හැඳින්වේ. | (........) |
| (34) | බ්‍රිතාන්‍යයන් විසින් සිය පාලනයේ මුල් අවධියේදී මාතර කොටුව ඉදිකරන ලදී. | රාජාධිරාජසිංහ රජතුමා විසින් මහනුවර දළදා මාලිගාව ඉදිකරවන ලදී. | (........) |
| (35) | ලක්දිව ප්‍රථම සංඝ භේදය වළගම්බා රජ්‍ය සමයේදී ඇති විය. | වළගම්බා රජතුමාගේ පාලන සමයේදී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන ලදී. | (........) |
| (36) | චන්ද්‍රභානු කෝරළ සෙබළුන් පිරිසක් සමඟ කාලිංගයේ සිට ශ්‍රී ලංකාව ආක්‍රමණය කළේය. | චන්ද්‍රභානුගේ ආක්‍රමණයේ ප්‍රධාන අරමුණ වූයේ ශ්‍රී ලංකාව තුළ හින්දු ආගම ප්‍රචාරය කිරීමයි. | (........) |
| (37) | 1948 දී ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලබාගැනීම. | එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගේ ආණ්ඩුව විසින් බස් ප්‍රවාහන සහ කොළඹ වරාය ජනසතු කරන ලදී. | (........) |
| (38) | 1972 දී පළමුවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හඳුන්වා දෙන ලදී. | ජේ. ආර්. ජයවර්ධන මහතා ශ්‍රී ලංකාවේ ප්‍රථම විධායක ජනාධිපතිවරයා විය. | (........) |
| (39) | ලන්දේසීන් විසින් ලංකාවට රෝමානු කතෝලික ආගම හඳුන්වා දෙන ලදී. | ලන්දේසීහු ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශවල ඇළ මාර්ග ඉදිකළහ. | (........) |
| (40) | ත්‍රිකුණාමලය ඉන්දියන් සාගරයේ | ඉතිහාසයේ ත්‍රිකුණාමලය මහාතිත්ථ නම් විය. | |

The National e-learning Portal for The General Education

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# ලංකා ඉතිහාසය - II

**13 ශ්‍රේණිය** | **කාලය පැය 03 යි.**

උපදෙස්:-

- **පළමුවන ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.**
  **(ප්‍රශ්න අංක 01 සඳහා පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ දළ සිතියමක් සපයා ඇත.)**

---

01. ඔබට සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න. ඒවායින් කැමැති දෙකක් පිළිබඳව කෙටි ඓතිහාසික සටහනක් ලියන්න.

(i) ජම්බුකෝලපට්ටන (ii) ජජ්ජරනදී (iii) පරාක්‍රම සමුද්‍රය
(iv) ගම්පොළ (v) කල්පිටිය (vi) හම්බන්තොට
(vii) සීතාවක (viii) නැගෙනහිර පළාත

(නිවැරදිව ලකුණු කිරීටම හා නම් කිරීමට ලකුණු 01 බැගිනි.
කෙටි ඓතිහාසික සටහනකට ලකුණු 05 බැගිනි.)

02. "දුටුගැමුණු රජතුමාගේ කාර්යසාඵල්‍යය උත්කෘෂ්ට ලෙස මහාවංසයෙහි දක්වා ඇත."

(i) දුටුගැමුණු රජතුමාගේ කාර්යසාඵල්‍යය විස්තර කොට ඇති මහාවංසයේ කතුවරයා නම් කරන්න.
(ii) දුටුගැමුණු රජතුමාට පෙර මාගම පාලනය කළ රජවරු දෙදෙනෙකු නම් කරන්න.
(iii) දුටුගැමුණු රජතුමාගේ දේශපාලන කාර්ය සංසිද්ධිය සැකෙවින් දක්වන්න.
(iv) මහාවංස කතුවරයා විසින් දුටුගැමුණු රජතුමාගේ කාර්ය සංසිද්ධිය උත්කෘෂ්ට තත්ත්වයට පත්කොට ඇති ආකාරය පරීක්ෂා කරන්න.

03. "කාවන්තිස්ස රජතුමාගේ විචක්ෂණශීලී රාජෝපක්‍රම දුටුගැමුණු රජතුමාගේ ජයග්‍රහණයට පදනම දැමීය. මේ ප්‍රකාශය විවේචනාත්මකව විමසන්න.

04. ශ්‍රී ලංකාවේ දේශපාලන එක්සත්භාවයක් ඇතිකළ බැවින් පළමුවන විජයබාහු හා පළමුවන පරාක්‍රමබාහු යන රජවරු දෙදෙනා නිසැකවම මෙරට ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ පාලකයෝ වෙති.

(i) පළමුවන විජයබාහු රජු බාල කාලයේ පටන් රැකබලාගෙන ඔහුට ආධාර දුන් ප්‍රදේශාධිපතියා නම් කරන්න. (ල. 02)
(ii) පළමුවන පරාක්‍රමබාහු රජතුමාගේ පියා සහ මව නම් කරන්න. (ල. 02)
(iii) ස්වකීය දේශපාලන කටයුතුවලදී පළමුවන විජයබාහු රජතුමා සහ පළමුවන පරාක්‍රමබාහු රජතුමා මුහුණ දුන් අභියෝග සැකෙවින් දක්වන්න. (ල. 04)
(iv) මෙම පාලකයන් තමන් මුහුණ දුන් අභියෝග ජයගත් ආකාරය සංසන්දනය කරමින් ඉහත දැක්වෙන ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ල. 07)

05. පොළොන්නරු පාලකයන්ගේ විදේශ ප්‍රතිපත්තිය පහත දැක්වෙන තේමා යටතේ විග්‍රහ කරන්න.

(i) විදේශ රටවල් ආක්‍රමණය කිරීම.

(ii) විවාහ සම්බන්ධතා

(iii) සංස්කෘතික සම්බන්ධතා (ල. 14)

06. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) දඹදෙනි යුගයේ සාහිත්‍යය

(ii) යාපනය රාජධානිය

(iii) හයවන පරාක්‍රමබාහු රජතුමා

(iv) දහවන සියවසේ දෙවන භාගයේ ඇති වූ සංස්කෘතික පුනර්ජීවනය

(v) ලංකා ජාතික සංගමය

(vi) 1956 මහා මැතිවරණය

07. උඩරට රාජධානියේ බිඳවැටීමට තුඩුදුන් සාධක විචාරාත්මකව විමසන්න. (ල. 14)

08. ශ්‍රී ලංකාවේ වැවිලි ආර්ථිකයේ සංවර්ධනය පහත සඳහන් මාතෘකා යටතේ පරීක්ෂා කරන්න.

(i) කෝපි කර්මාන්තයේ සංවර්ධනයට හා පරිහානියට දායක වූ ප්‍රධාන සාධක

(ii) වැවිලි ආර්ථිකය යටතේ ඇති වූ ආර්ථික හා සමාජයීය වෙනස්වීම්

The National e-learning Portal for the General Education

(01) ප්‍රශ්නයට අදාළ ශ්‍රී ලංකා ආකෘති සිතියම

